# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2016 ජනවාරි මස 19 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.44 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**•පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ සහ බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජගත් කුමාර | යූ.එල්.එන්.පී. උඩවෙල |
| අනුරාධ විමලරත්න | ජගත් පී. විතාන | රජිත හපුආරච්චිගේ |
| අනුරුද්ධ ලේකම්ගේ | ජනක දීපාල් වැලිවත්ත | රවීන්ද්‍ර යසස් කුමානායක |
| අශෝක දයාරත්න | ජයන්ත ද සිල්වා | රවී විජේසේකර |
| අමල් සිල්වා | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | රොජර් සෙනෙවිරත්න |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර | රොයිස් විජිත |
| ඇන්ටනී උපුල් රාජිත | තුවාන් ආමිත් මොහමඩ් අක්රම් | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය |
| ඉන්දික බණ්ඩාර | තෙබුවන පියනන්ද හිමි | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් | නව්සර් ෆව්සි | ලලන්ත ගුණසේකර |
| ඊ.ඒ. නන්දන පත්මකුමාර | නිමල් චන්ද්‍රරත්න | ලලිත් වර්ණකුමාර |
| උදාර රත්නායක | නිරෝෂන් පාදුක්ක | ලෙනාඩ් කරුණාරත්න |
| උදේන විජේරත්න | නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | විජිත් ප්‍රියන්ත |
| උපාලි ගුණරත්න | පී.ආර්.පී. අබේගුණවර්ධන | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| උපාලි කොඩිකාර | පී.ඩී. අබේරත්න | සරත් පතිරණ |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | ප්‍රදීප් උඩුගොඩ | සරත් සුමනසේකර |
| එස්.එම්. සකාවුල්ලා | ප්‍රදීප් පෙරේරා | සලෝචන ගමගේ |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සහන් ප්‍රදීප් |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | මල්ෂා කුමාරණතුංග මැතිනිය | සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා |
| කිත්සිරි කහටපිටිය | මහේෂ් අල්මේදා | සුනිල් වටගල |
| කීර්ති කාරියවසම් | මංජුල ප්‍රසන්න සම්පත් | සුසිල් කිඳෙල්පිටිය |
| කුරුසාමි කලන්කාඩ් තේවර් | මංජුල බුද්ධදාස | ශිරන්ත අමරසේකර |
| කොලන්නගේ වජිර පෙරේරා | මෙරිල් පෙරේරා | ශ්‍රීනාත් පෙරේරා |
| කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය | මොරිස් විජේරත්න | හරිස්චන්ද්‍ර කොස්තා |
| ගුණසිරි ජයනාත් | මොහොමඩ් ෆයිරූස් | හෙක්ටර් බෙත්මගේ |
| චන්දන ජයකොඩි | මොහොමඩ් ෆායිස් | |

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අසෝක රන්වල | ජගත් අංගගේ | රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | නිමල් ආර්. පීරිස් | ලයනල් ජයසිංහ |
| එම්.එස්.එම්. රහීම් | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | ලලිත් එල්ලාවල |
| එස්. කුහවරදන් | නිරෝෂා අතුකෝරල මැතිනිය | සුසාර දිනාල් |
| කාමල් කුරුප්පු | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | සෙනල් වෙල්ගම |
| කේ.ඩී. අරුණ දීපාල් | මහින්ද ජයසිංහ | සේනක දමයන්ත ද සිල්වා |
| ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | රන්දීර් රොද්රිගෝ | |

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදනය :

*"2016 පෙබරවාරි මස 09 වන දින පැවැත්වෙන සභා රැස්වීමේ පටන් ඉන් ඉදිරියට පැවැත්වෙන සභා රැස්වීම් පෙ.ව. 09.30 සිට තේ විවේකයකින් තොරව පවත්වා ගෙන යෑමටත්, උදෑසන ආහාර, තේ පැන් සඳහා භෝජනාගාරය පෙ.ව. 09.00 සිට විවෘතව තැබීමටත් කටයුතු කළ යුතු බව 2016.01.06 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කරන ලද බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

2015.12.10 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව [කාරක සභාවේ සභාපති වෙනුවෙන්] ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

අනතුරුව, 2016.01.06 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 09.50 ට සභාවේ ගණපූරණය නොමැති බව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදින්, ගරු සභාපතිතුමා විසින් කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***

***පසුවද, ගණපූරණය ඇති නොවූ බැවින්, පූ.භා. 09.55 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 10.46 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

## 03. ශෝක ප්‍රකාශ යෝජනාව I : ගරු තිලකරත්න රාජපක්ෂ මැතිතුමා

සුනිල් ජයමිණි ගරු සභානායකතුමා විසින් පහත සඳහන් ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙවන පළාත් සභාවට හා තෙවන පළාත් සභාවට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින්ද, සිව්වන පළාත් සභාවට හා පස්වන පළාත් සභාවට එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින්ද කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත් වී වසර දහනවයකට අධික කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී තිලකරත්න රාජපක්ෂ මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

***අ.භා. 12.04 ට, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***ශෝක ප්‍රකාශ යෝජනාව ඇතුළත් නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීතුමාගේ ඥාතීන් වෙත ලැබෙන්නට සලස්වන මෙන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ලේකම්වරයාට දැනුම් දෙන ලදී.***

***අ.භා. 12.53 ට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

## 04. ශෝක ප්‍රකාශ යෝජනාව II : ගරු අජිත් අමරසිරි මැතිතුමා

සුනිල් ජයමිණි ගරු සභානායකතුමා විසින් පහත සඳහන් ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට එක්සත් සමාජවාදී පෙරමුණ නියෝජනය කරමින්ද කළුතර පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත් වී වසර හතරකට*

*අධික කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී අජිත් අමරසිරි මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

***ශෝක ප්‍රකාශ යෝජනාව ඇතුළත් නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීතුමාගේ ඥාතීන් වෙත ලැබෙන්නට සලස්වන මෙන ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ලේකම්වරයාට දැනුම් දෙන ලදී.***

## 05. කල් තැබීමේ යෝජනාව :

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.25 ට, 2016 පෙබරවාරි මස 09 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.01.20
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/20
Minuts 2016.01.19 - Hansard Section